ET/SSS/2022(2023)/OL/87/S/Q/S-1

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Communication and Media Studies

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය




**Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)**

දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 87 | S | I |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
கல்விப் பொதுத் தராதரப் பத்திர )சாதாரண தர(ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I,II**
**தொடர்பாடலும் ஊடகக் கல்வியும் I,II**
**Communication and Media Studies I,II**

*පැය තුනයි.*
*மூன்று மணித்தியாலம்*
*Three Hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.**
**மேலதிக வாசிப்பு நேரம் 10 -நிமிடங்கள்**
Additional Reading Time – 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I**

**සැලකිය යුතුයි:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමි වේ.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

**1.** ඊයේ රාත්‍රියේ දුටු සිහිනය තවමත් සිත බිය ගන්වන බව ඇගේ සිතට දැනුණි. මෙම ප්‍රකාශය අදාළ වන්නේ,

(1) පුද්ගලාන්තර සන්නිවේදනයට ය. (2) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයට ය.
(3) ජන සන්නිවේදනයට ය. (4) සමූහ සන්නිවේදනයට ය.

**2.** දොරටුපාලගේ කාර්යය වන්නේ,

(1) සන්දේශයෙහි අර්ථය පැහැදිලි කරදීම යි.
(2) තොරතුරු ගලා එන දොරටු අවහිර කිරීම යි.
(3) ග්‍රාහකයාට ලැබෙන තොරතුරු වාරණය කිරීම යි.
(4) ග්‍රාහකයා වෙත යන සන්දේශය පාලනය කිරීම යි.

**3.** සම්මන්ත්‍රණයේ දී ලබා දුන් මුද්‍රිත නිබන්ධනයේ පිටු තුනක ම අක්ෂර එක මත එක මුද්‍රණය වී තිබීම නිසා අන්තර්ගතය තේරුම් ගැනීම අපහසු විය. මෙම සිදුවීම,

(1) අර්ථ බාධක අවස්ථාවකි. (2) පාරිසරික බාධාවකි.
(3) මාධ්‍ය බාධක මෙන්ම තාක්ෂණික බාධාවකි. (4) අර්ථ බාධා මෙන්ම තාක්ෂණික බාධාවකි.

**4.** පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ පියවරක් **නොවන්නේ,**

(1) මුද්‍රණ යන්ත්‍රය මගින් මුල් පිටපත මුද්‍රණය (2) ආදර්ශ පිටපතට අනුකූලව පිටපත් ලබා ගැනීම යි.
(3) අත්පිටපත යතුරු ලියනය කිරීම යි (4) පරිගණකය මගින් අක්ෂරයෝජනය කළ හැකි වීම යි.

**5.** වාචික සන්නිවේදන නිපුණතා සංවර්ධනය කර ගැනීම සඳහා හේතු වේ.

(1) වාග්මාලාව පුළුල් කරගැනීම (2) වෙනත් අයගේ කතා අනුකරණය නොකිරීම
(3) ලේඛන පරිශීලය අවම කිරීම (4) නිරන්තරයෙන් රූපවාහිනී වැඩසටහන් නැරඹීම

**6.** සන්නිවේදන ක්‍රියාවලිය අංග සම්පූර්ණ වන්නේ,

(1) ග්‍රාහකයා බලපෑමට ලක්වීමෙනි. (2) ග්‍රාහක ප්‍රතිපෝෂණය ලැබීමෙනි.

(3) සන්නිවේදන අරමුණු ඉටු වීමෙනි. (4) සන්නිවේදන ග්‍රාහක භූමිකා ස්ථාවරව පැවතීමෙනි.

**7.** ඩොට් මුද්‍රණ යන්ත්‍රය සම්බන්ධයෙන් වඩාත් නිරවද්‍ය ප්‍රකාශයක් වන්නේ,

(1) අකුරු මුද්‍රණය වන්නේ තිත් වශයෙන් එක් වීමෙනි.

(2) තීන්ත යොදාගෙන කළු, සුදු හෝ වර්ණ පිටපත් ලබා ගත හැකි ය.

(3) මුද්‍රණ යන්ත්‍රයට යොදා ඇති කුඩු භාවිතයෙන් මුද්‍රණය සිදු වේ.

(4) කළු - සුදු හෝ වර්ණ හෝ පිටපත් ලබා ගත හැකි ය.

**8.** පහත කරුණුවලින් අවාචික සන්නිවේදනයට අයත් වන්නේ,

(1) හිස වැනීම, අත වැනීම, කථා රටා පුහුණුව

(2) අත්පුඩි ගැසීම, ගීතිය, නිවේදන

(3) මහජන කථනය, නිවේදනය කිරීම, කථික තරගය

(4) හිස වැනීම, අත වැනීම, මුහුණේ ඉරියව්

**9.** විද්‍යුත් චුම්භක සංඥා සම්ප්‍රේෂණයෙන් තොරව අසන්නා වෙත ළඟා වන ගුවන්විදුලි සේවාව වන්නේ,

(1) එෆ් එම් රේඩියෝව යි. (2) ජංගම දුරකතන රේඩියෝව යි.

(3) වෙබ් රේඩියෝව යි. (4) පරිගණක රේඩියෝව යි.

**10.** ජී.ඩී.පැලිස් අප්පුහාමි මහතා විසින් සංස්කරණය කර ප්‍රකාශයට පත් කළ පුවත්පත වන්නේ,

(1) ලංකාලෝකය (2) කවට කතිකයා

(3) සරසවි සඳරැස (4) ලක්මිණි පහණ

**11.** මෙහි දැක්වෙන උපකරණය සම්බන්ධයෙන් වඩාත් යෝග්‍ය ප්‍රකාශය මින් කුමක් ද?



(1) ඡායාරූප පිටපත්කරණය සඳහා යොද ගනු ලබයි.

(2) ලේඛනයක පිටපතක් ලබාගැනීම සඳහා යොද ගනු ලබයි.

(3) පිටකවරය ප්ලාස්ටික් ආවරණයක් යොදා සැකසීමට යොදා ගත හැකියි.

(4) ලේඛනයේ පිටපතක් විද්‍යුත් ක්‍රමයට ලබා ගන්නා යන්ත්‍රය, එය ස්ටෙන්සිල් පත්‍රයක සටහන් කර ගනී.

**12.** ජන මාධ්‍ය නියෝජන අධ්‍යයනය තුළ පුරවැසියෙකුගේ යහපත් ලක්ෂණයක් **නොවන්නේ,**

(1) ප්‍රජාතන්ත්‍රවාදීව ජීවත් වීම යි. (2) ඡන්ද අයිතිය භාවිත කිරීම යි.

(3) නීති ගරුක වීම යි. (4) තම ආගමට හා ජාතියට පමණක් ගරු කිරීම යි.

**14.** එක්ස්ප්‍රස් නිව්ස් පේපර්ස් පුද්ගලික සමාගම විසින් ප්‍රකාශයට පත් කරන දමිළ පුවත්පත,

(1) තිනකරන් ය. (2) තිනක්කුරල් ය.

(3) උයද තාරකෙ ය. (4) වීරකේසරි ය.

**13.** ලිඛිත සන්නිවේදනයේ දී භාවිත වන ඵලදායී ලේඛනයක ලක්ෂණ ඇතුළත් **නොවන** පිළිතුර තෝරන්න.

(1) නිරවුල් හා පැහැදිලි බව (2) සම්මත ව්‍යාකරණ විධි භාවිතය

(3) කැමති ආකෘතියකට රචනා කිරීම (4) නිර්මාණශීලී බව

❖ **මෙහි සඳහන් ආකෘතිය ඇසුරින් 15 - 16 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




**15.** මෙහි සඳහන් ආකෘතියට බොහෝ සෙයින් සමාන සන්නිවේදන ආකෘතියක් නිර්මාණය කර ඇත්තේ,

(1) ක්ලෝඩ් ෂැනොන් හා වොරන් වීවර් ය. (2) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය.

(3) විල්බර් ශ්‍රාම් ය. (4) තෝමස් අල්වා එඩිසන් ය.

**16.** ඉහත දැක්වෙන සන්නිවේදන ආකෘතියට අනුව A,B,C,D,E විය හැක්කේ,

(1) සන්නිවේදකයා, සම්ප්‍රේෂකය, ග්‍රාහකයා, අග්‍රස්ථානය, ඝෝෂා ය.

(2) සන්නිවේදකයා, සන්දේශය, මාධ්‍ය, ග්‍රාහකයා, බාධක ය.

(3) තොරතුරු මූලාශ්‍රය, ලැබූ සංඥා, සම්ප්‍රේෂකය, ග්‍රාහකයා, ඝෝෂා ය.

(4) තොරතුරු මූලාශ්‍රය, සම්ප්‍රේෂකය, ග්‍රාහකයා, අග්‍රස්ථානය, ඝෝෂා ය.

**17.** ඡායාරූපයක් ගැනීමේ දී පසුකළයුතු පියවරක්වන "අනාවරණය" වඩා හොඳින් නිර්වචනය කළ පිළිතුර වන්නේ,

(1) ඡායාරූපයට හසුකර ගන්නා අරමුණ වඩාත් පැහැදිලි වන සේ කාචය සීරු මාරු කර ගැනීම යි.

(2) කාච විවරයේ හා දිවාරයේ පිහිටීම නිසි පරිදි සකස් කොට ආලෝකය පාලනය කිරීම හා ප්‍රතිබිම්බය සටහන් කර ගැනීම යි.

(3) රූප රාමුවට ඇතුළත්වන දර්ශනය අනුව කැමරාව පිහිටුවා ගැනීම යි.

(4) කාචය යම් වස්තුවක් නාභිගත කළ පසු එම වස්තුවේ සිට ඉදිරියට සහ පසුපසට පැහැදිලිව පෙනෙන දුර ප්‍රමාණය යි.

**18.** බුද්ධිමය දේපළ විෂයයෙහි සුවිශේෂ ලක්ෂණයක් වන්නේ, එය වෙනත් චංචල හෝ නිශ්චල දේපළ මෙන් ස්පර්ශ කළ නොහැකි වීමයි. මින් අදහස් වන්නේ,

(1) ස්පර්ශ කළ හැකි කිසිවකට බුද්ධිමය හිමිකමක් නොමැති බව යි.

(2) බුද්ධිමය දේපළ යනු, අස්පර්ශනීය දේපළක් බව යි.

(3) බුද්ධිමය දේපළ යනු නිශ්චල දේපළක් බව යි.

(4) බුද්ධිමය දේපළ ආශ්වාදනීය දේපළක් බව යි.

**19.** පහත දැක්වෙන්නේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයන ගුරුතුමා හා සිසුන් අතර ඇති වූ කතාබහකින් උපුටාගත් කොටසකි.

**යසස්** - එක මොහොතක දී රටේ ලෝකෙ ගොඩක් තැන්වල කොච්චර දේවල් වෙනව ද? ඒවට අපි කියන්නෙ සිදුවීම් කියලා.

**ගුරුතුමා** - යම් සිදුවීමක් කිසියම් කෙනෙක් නිරීක්ෂණය කරලා ඒක තවත් කෙනෙකුට සන්නිවේදනය කරනවා නම් අන්න ඒ දේට අපි කියනවා තොරතුරු කියලා.

**අනුහස්** - ජනතාවට බලපාන්නා වූත්, ඔවුන් තුළ උනන්දුවක් ඇති කරන්නා වූත්, මෑත කාලීන වැදගත් සිදුවීමකට අදාළ අලුත් තොරතුරුවලටයි ප්‍රවෘත්ති කියන්නේ.

ඉහත සංවාදයේ දී සත්‍ය ප්‍රකාශ කරන්නේ,

(1) ගුරුතුමා හා යසස් පමණි. (2) අනුහස් හා යයස් පමණි.
(3) ගුරුතුමා සහ අනුහස් පමණි. (4) ගුරුතුමා, යසස්, අනුහස් යන තිදෙනාම යි.

❖ **පහත දැක්වෙන තොරතුරු මූලාශ්‍ර ඇසුරින් 20 සිට 22 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | | |
|---|---|---|
| A. ග්‍රාම නිලධාරීන් | B. රාජ්‍ය අමාත්‍යාංශ | C. මූල්‍ය ආයතන |
| D. සමාජ ජාල වෙබ් අඩවි | E. ගුරුවරුන් | F. සංගත තැටි |
| G. චරිතාපදාන | H. ලේකම් මිටි | I. සෙල් ලිපි |

**20.** ඉහත ඒවා අතරින් මාධ්‍ය මූලාශ්‍රවලට පමණක් අයත් වරණය වන්නේ,
(1) B හා D ය. (2) D හා F ය. (3) F පමණි. (4) D පමණි.

**21.** ලිඛිත ආකාරයෙන් තොරතුරු ගබඩා කර ඇති මූලාශ්‍ර පමණක් අයත් වන්නේ,
(1) A,C,D හා I ය. (2) C,F,G හා H ය. (3) F,G,I හා H ය. (4) I,H,G හා D ය.

**22.** ව්‍යාජ මුදල් නෝට්ටු පිළිබඳ ජනතාවට ඉතා ඉක්මනින් තොරතුරු ලබා දිය හැකි මූලාශ්‍ර,
(1) B හා C ය. (2) C හා D ය. (3) D හා F ය. (4) C හා F ය.

**23.** සරල ආකෘතියකින් ගුවන්විදුලිය සංවර්ධනය කිරීමට හේතු වූ විශිෂ්ටතම සොයාගැනීම වන්නේ,
(1) වැල්වය යි. (2) ට්‍රාන්ස්මීටරය යි.
(3) වයර්ලස් ටෙලිග්‍රාෆ් ක්‍රමය යි. (4) රහැන් රහිත සංඥා භාවිතය යි.

**24.** වැඩි දෙනාගේ කැමැත්ත හා අවධානය දිනා ගන්නා ප්‍රවෘත්ති වර්ගය,
(1) දෘඪ පුවත් ය. (2) කාලීන පුවත් ය.
(3) ක්ෂණික පුවත් ය. (4) මෘදු පුවත් ය.

**25.** කොටසින් කොටස කතාවේ තේමාව වෙනස් කරමින් රචනා කරන ටෙලි නාට්‍ය වර්ගයකි.
(1) විවිධාංගික නාට්‍ය (2) ඒකාංගික නාට්‍ය
(3) මෙගා නාට්‍ය (4) ප්‍රාසාංගික නාට්‍ය

**26.** රූපයෙහි දැක්වෙන යන්ත්‍රය සම්බන්ධ **සාවද්‍ය** ප්‍රකාශයක් වන්නේ,



(1) යම් ලිපියක් කාර්යාලයට ලැබුණු දිනය සහතික කරනු ලබයි.
(2) මෙය තොරතුරු හුවමාරු කිරීමේ මාධ්‍ය උපකරණයකි.
(3) සමහර විට මෙහි සන්නිවේදන ක්‍රියාවලිය නෛතික කාර්යයන්හි දී ද යොදා ගනී.
(4) ඇතැම් කාර්යාලවල තම කාර්යාලයේ නම ද අදාළ අංශයේ නම ද ඇතුළත් කර මෙය සකස් කර ගත හැකි ය.

**27.** ලංකා ඉතිහාසයේ ප්‍රථම පුද්ගලික පුවත්පත් ආයතනය වන්නේ,
(1) ලංකාදීප පුවත්පත් ආයතනය යි. (2) එම්.ඩී. ගුණසේන ආයතනය යි.
(3) ලේක්හවුස් ආයතනය යි. (4) විජය පුවත්පත් ආයතනය යි.

**28.** සංඛ්‍යාංක ඡායාරූපයක වර්ග අඟලක් තුළ පවතින පික්සල් (Pixel) ප්‍රමාණය යනු,

(1) රූප සංරචනය යි. (2) විභේදන බලය යි.

(3) ස්වර්ණමය රීතිය යි. (4) ක්ෂේත්‍ර ගැඹුර යි.

**29.** අතීතයේ ලේඛනවලින් පිටපතක් ලබා ගැනීමේ දී මුහුණ පෑ ගැටලු මොනවා ද?

A. අත්පිටපත් විශාල සංඛ්‍යාවක් එකවර ලිවීමට අපහසු වීම

B. එක් අයෙකුට තනිව පිටපත් බොහෝ ගණනක් ලිවීමට සිදු වීම

C. කල්ගත වීම

D. පිරිවැය වැඩි වීම

(1) A,B,C නිවැරදි ය. (2) D පමණක් වැරදි ය.

(3) A,B,C,D නිවැරදි ය. (4) A,B,C,D වැරදි ය.

**30.** ගුවන්විදුලි හා රූපවාහිනී නාලිකා සඳහා බලපත්‍ර ලබා දීම සිදු කරන්නේ,

(1) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යි. (2) විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාව යි.

(3) මානව හිමිකම් කොමිෂන් සභාව යි. (4) ජනමාධ්‍ය අමාත්‍යාංශය යි.

**31.** පහත ඒවා අතරින් නිර්මාණයක ගුණාංගවලට අයත් වීමට අවම ඉඩක් ඇති කරුණක්/කරුණු අඩංගු පිළිතුර කුමක් ද?

(1) නැවුම් බව හා සුවිශේෂී බව

(2) ප්‍රයෝජනවත් බව හා අර්ථසම්පන්න බව

(3) පුද්ගලබද්ධ වීම හා සංවේදී බව

(4) සියුම් ලෙස සිතීමේ හැකියාව හා ඉහළ රුචිකත්වයක් ඇති කිරීම

**32.** ගුවන්විදුලිය බිහිවීම කෙරෙහි බලපෑ විද්‍යුත් සංඥා සම්ප්‍රේෂණ ක්‍රමය සොයාගනු ලැබුවේ,

(1) ගුග්ලි එල්මෝ මාර්කෝනි (2) සැමුවෙල් එෆ්. බී. මෝස්

(3) එඩ්වඩ් හාපර් (4) ජෝර්ජ් ඊස්ට්මන්

**33. * මාධ්‍ය සමඟ නිතර සම්බන්ධතා පවත්වයි.**
*** මාධ්‍ය කෙරෙහි වැඩි විශ්වාසයක් තබයි.**
*** විද්‍යුත් මාධ්‍යයට නිතර දුරකථන ඇමතුම් ලබා ගනිමින් ඉල්ලීම් කරයි. කෙටි පණිවිඩ යවයි.**

ඉහත කරුණුවලින් කියැවෙන්නේ,

(1) නිෂ්ක්‍රීය ග්‍රාහකයෙකු පිළිබඳව ය. (2) සක්‍රීය ග්‍රාහකයෙකු පිළිබඳව ය.

(3) විචාරශීලී ග්‍රාහකයෙකු පිළිබඳව ය. (4) ක්‍රියාකාරී ග්‍රාහකයෙකු පිළිබඳව ය.

**34.** ලංකාවේ ලියාපදිංචි කළ පළමුවැනි සිංහල පුවත්පත

(1) ලක්මිණිපහන (2) ලංකාලෝකය (3) ඥානාර්ථ ප්‍රදීපය (4) සත්‍ය මාර්ගය

**35.** නායයෑම් සහිත ප්‍රදේශයක අවදානම් තත්ත්වය පිළිබඳ ගුවන්විදුලි විකාශයක් තුළින් තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා ඔබට අවස්ථාවක් ලැබේ. මෙම ගුවන්විදුලි වැඩසටහන අයත් වන ආකෘතිය කුමක් ද?

(1) නිවේදන (2) වාර්තා වැඩසටහන් (3) විචිත්‍රාංග (4) වාර්තා කථන

**36.** ''කිසියම් රටක සන්නිවේදන ක්‍රියාකාරිත්වය මාධ්‍ය ආචාර ධර්ම මගින් පමණක් පාලනය කළ නොහැකි ය.'' මීට හේතු වන්නේ,

(1) මාධ්‍ය ආචාරධර්ම මෘදු නියාමනයක් වීම යි.

(2) මාධ්‍ය ආචාරධර්ම දෘඪ නියාමනයක් වන නිසා ය.

(3) මාධ්‍ය නිර්මාණකරුවන් වෙතින් මාධ්‍ය නීති සුරක්ෂිත වන නිසා ය.

(4) මාධ්‍ය නිර්මාණකරුවන් සමාජ වගකීමෙන් යුතුව කටයුතු කිරීම යි.

**37.** ශ්‍රී ලංකාවේ රජයේ නිලධාරීන් අතින් සිදුවන මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට පිහිටුවා ඇත්තේ,

(1) පුවත්පත් පැමිණිලි කොමිසම යි. (2) වංචා හා දූෂණ පිළිබඳ පැමිණිලි කොමිසම යි.

(3) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම යි. (4) නීති ආධාර කොමිසම යි.

**38.** අනෙකුත් මාධ්‍යවලට සාපේක්ෂ ව ගුවන්විදුලියේ දැකිය හැකි ප්‍රබලතාවක් වන්නේ මින් කුමක් ද?

(1) ශ්‍රාවකයාට පහසුවෙන් සම්බන්ධවිය හැකි නොවීම

(2) භූගෝලීය බාධක සුලබ වීම

(3) අඩු වියදම් මාධ්‍යයක් වීම

(4) කනට ඇසෙන්නේ එක්වරක් පමණක් වීම

**39.** ''නිර්මාණය'' යන සංකල්පය පිළිබඳ තිදෙනෙකුගේ අදහස් පහත දැක්වේ.

දිලිනි - නැවුම් බව හා සුවිශේෂ බව සහිත ප්‍රයෝජනවත්, අර්ථසම්පන්න අදහසක් ඔස්සේ බිහි වන යමකි.

තිළිණි - පෙර නොවූ විරූ අපූරු දෙයකි.

සචිනි - නිර්මාණයක් ගුණාත්මක සන්නිවේදන කාර්යය ඉටු කර ගැනීම සඳහාත් ඉහළ රුචිකත්වයක් ඇති කිරීම සඳහාත් අත්‍යවශ්‍ය නොවේ.

මේ අතරින් **සාවද්‍ය** ප්‍රකාශ කරන්නේ,

(1) දිලිනි හා සචිනි ය.

(2) සචිනි පමණක් ය.

(3) දිලිනි හා තිළිණි ය.

(4) මේ තිදෙනාගෙන් එක් අයෙක්වත් නොවේ.

**40.** කෙටි කාලයකින් සිත් ඇදගන්නා ලෙස තොරතුරක් හෝ පණිවිඩයක් ඉදිරිපත් කිරීමට යොදා ගන්නා නිවේදන ආකෘති 3 කි.

(1) අවධාරිත නිවේදන, කිංකිණි නිවේදන, වෙළෙඳ නිවේදන

(2) වාර්තා නිවේදන, විශේෂාංග නිවේදන, වෙළෙඳ නිවේදන

(3) අවධාරිත නිවේදන, වෙළෙඳ නිවේදන, සජීවී නිවේදන

(4) සජීවී නිවේදන, වෙළෙඳ නිවේදන, කිංකිණි නිවේදන

*****

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**கல்வி அமைச்சு**
**Ministry of Education, Sri Lanka**

| 87 | S | II |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
கல்விப் பொதுத் தராதரப் பத்திர )சாதாரண தர(ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I,II**
தொடர்பாடலும் ஊடகக் கல்வியும் I,II
**Communication and Media Studies I,II**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II**

* **පළමුවැනි** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක් ද** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* **පළමුවැනි** ප්‍රශ්නයට ලකුණු 20ක් හිමිවන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමි වේ.

1. වාර්ෂිකව පවත්වන පාසල් නිවාසාන්තර ක්‍රීඩා උළෙල මෙවර ද උත්කර්ෂවත් අන්දමින් පැවැත්විය යුතු බව උදෑසන රැස්වීමේ දී විදුහල්පතිතුමා ගුරුභවතුන්ට හා සිසුන්ට පැවසීය.

(i) ඉහත අවස්ථාවට අදාළ වන සන්නිවේදන වර්ගය කුමක් ද?

(ii) එම සන්නිවේදන වර්ගයට අදාළ විශේෂතා **දෙකක්** නම් කරන්න.

(iii) විදුහල්පතිතුමාගේ කතාවේ දී භාවිත කරන ලද නිර්වාචික සන්නිවේදන විධික්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(iv) සන්නිවේදනයේ මූලික කාර්යයන් **දෙකක්** නම් කරන්න.

(v) පාසල් උදෑසන රැස්වීම විධිමත් සන්නිවේදන අවස්ථාවක් බවට තහවුරු කළ හැකි සාධක **දෙකක්** දක්වන්න.

(vi) නිවාසාන්තර ක්‍රීඩා උළෙල ප්‍රචාරය සඳහා යොදාගත හැකි විද්‍යුත් මාධ්‍යයක් හා මුද්‍රිත මාධ්‍යයක් බැගින් නම් කරන්න.

(vii) සන්නිවේදන ක්‍රියාවලියේ දී සිදුවිය හැකි ප්‍රධාන බාධක **දෙක** නම් කරන්න.

(viii) නිවාසාන්තර ක්‍රීඩා උළෙලට අදාළව කණ්ඩායම් ලෙස තොරතුරු සන්නිවේදනය කළ හැකි නව මාධ්‍ය විධික්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(ix) සන්නිවේදන ක්‍රියාවලිය තුළ බාධක යන්න ආකෘතියක් මගින් මුලින්ම ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද?

(x) අන්තර්ජාල තාක්ෂණයේ ආගමනයත් සමඟ මාධ්‍යයන් එකට පරිහරණය කිරීමේ හැකියාව හඳුන්වන්නේ කුමන නමකින් ද?

2. පුද්ගලයෙකුගේ සන්නිවේදන කාර්යය ආරම්භ වන්නේ අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයෙනි. එය අත්දැකීම් මත ගොඩ නැගෙන්නකි.

(i) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ විශේෂතා **දෙකක්** සඳහන් කරන්න.

(ii) පුද්ගල මනෝභාවයන් උචිත ලෙස ගලපමින් ටෙලි නාට්‍ය පිටපතක් රචනා කළේ යැයි සිතන්න. ටෙලි නාට්‍ය පිටපත අයත්වන සන්නිවේදන ස්වරූපය දක්වා එහි ලක්ෂණ **දෙකක්** විස්තර කරන්න.

(iii) කෙනෙකු දිගින් දිගටම ලිවීමේ දී ලේඛන නිපුණතාව ලබා ගත හැකිය. ඵලදායී ලේඛනයක ලක්ෂණ **තුනක්** විස්තර කරන්න.

(iv) පාසල් ශිෂ්‍යයෙකුට ලේඛන කුසලතා වර්ධනය කර ගැනීම සඳහා කළ හැකි කාර්යයන් **හතරක්** පැහැදිලි කරන්න.

3. නූතනයේ ජන මාධ්‍ය හා නව මාධ්‍යවල වාණිජ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා නිර්මාණාත්මක සන්නිවේදන විධික්‍රම බහුල ලෙස භාවිතයට ගැනේ.

(i) ජන මාධ්‍ය තුළ දක්නට ලැබෙන නිර්මාණාත්මක වැඩසටහන් **දෙකක්** නම් කරන්න.

(ii) යම් නිර්මාණයක දැකිය හැකි නිර්මාණාත්මක ගුණාංග **දෙකක්** විස්තර කරන්න.

(iii) සන්නිවේදන ක්‍රියාවලිය වඩාත් නිර්මාණාත්මකව සිදු කිරීම සඳහා විවිධ ප්‍රකාශන ක්‍රම භාවිත කරනු ලබයි. එවැනි විධික්‍රම **තුනක්** විස්තර කරන්න.

(iv) ඵලදායී ලෙස රූපවාහිනී මාධ්‍ය පරිහරණය කිරීම මගින් ලබා ගත හැකි ඉගෙනුම් අවකාශ **හතරක්** විස්තර කරන්න.

4. ඡායාරූප ගැනීමේ නිපුණතා සංවර්ධනය වන්නේ ඡායාරූප ශිල්පියා තුළ ය. කැමරාව හසුරුවන ශිල්පියාට එහි තාක්ෂණය පිළිබඳ වැදගත් වේ.

(i) නිශ්චල ඡායාරූපයක් යන්න සරලව හඳුන්වන්න.

(ii) නිශ්චල ඡායාරූපයක් ගැනීමේ දී ඊට සම්බන්ධ වන පාර්ශ්ව **හතර** නම් කරන්න.

(iii) ඡායාරූපයක් ගැනීමේ දී අනුගමනය කරනු ලබන පියවර **තුනක්** විස්තර කරන්න.

(iv) නිශ්චල ඡායාරූප භාවිතය නිසා මුද්‍රිත මාධ්‍යයට ලැබෙන වාසි **හතරක්** විස්තර කරන්න.

5. මානව සමාජය ඉතා සංකීර්ණ වූවකි. විවිධ මානව, සංස්කෘතික, ආධ්‍යාත්මික හා නෛතික බැඳීම් පාදක කරගනිමින් සමාජයට අනුගත වීම දක්නට ලැබේ.

(i) සමාජයීය නියෝජන අධ්‍යයනය සිදුකළ හැකි ක්ෂේත්‍ර **දෙකක්** සඳහන් කරන්න.

(ii) පුරවැසියා පරමාදර්ශී ලෙස ජීවත්වීමේ දී ඔහු තුළ දැකිය හැකි ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.

(iii) ජන මාධ්‍යයේ ආර්ථික නියෝජනය අධ්‍යයනය කළ හැකි ක්ෂේත්‍රයක් ලෙස වැඩ ලෝකය හා සම්බන්ධ ජන මාධ්‍ය වැඩසටහන් **තුනක්** පැහැදිලි කරන්න.

(iv) සදාචාර හා සාරධර්ම ප්‍රවර්ධනය සඳහා ජන මාධ්‍ය මගින් ඉදිරිපත් කරන වැඩසටහන් **දෙකක්** නිදසුන් සහිතව විස්තර කරන්න.

6. මාධ්‍ය ආයතනයකට නවක සන්නිවේදකයින් බඳවා ගන්නා බව සඳහන් දැන්වීමක් පුවත්පතක පළ කර ඇත.

(i) මාධ්‍ය ආයතනයක් පවත්වාගෙන යාමේ ප්‍රධාන අරමුණු **දෙක** සඳහන් කරන්න.
(ii) මාධ්‍ය වෙත ප්‍රතිචාර ඉදිරිපත් කළ හැකි ක්‍රම **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.
(iii) මෑත යුගයේ අංකිත තාක්ෂණය පදනම් කරගෙන බිහි වූ නව මාධ්‍යයේ විශේෂතා **තුනක්** විස්තර කරන්න.
(iv) සන්නිවේදන උපකරණයක් ලෙස ජංගම දුරකථන භාවිතයේ දී පිළිපැදිය යුතු ආචාරධර්ම **හතරක්** විස්තර කරන්න.

7. ඕනෑම සන්නිවේදන කාර්යයක වැදගත් මූලාශ්‍රය වනුයේ තොරතුරු වේ. සන්නිවේදන කාර්යයට අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි විවිධ මූලාශ්‍ර පවතී.

(i) තොරතුරු ලබා ගැනීමේ මාධ්‍ය මූලාශ්‍ර සඳහා උදාහරණ **දෙකක්** සපයන්න.
(ii) තොරතුරු වාර්තාකරණයේ ප්‍රධාන අවස්ථා **දෙක** කෙටියෙන් පැහැදිලි කරන්න.
(iii) තොරතුරක විශ්වසනීයත්වය ආරක්ෂා වන අයුරින් තොරතුරු රැස් කිරීමේ දී සැළකිය යුතු කරුණු **තුනක්** විස්තර කරන්න.
(iv) නිර්මාණාත්මක රචනයක් සඳහා භාවිත කළ හැකි උඩුකුරු පිරමීඩ ආකෘතිය ඇඳ විස්තර කරන්න.

*****